# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்பகைத்தொழில்மற்றும்சமூகவலுவூட்டல்அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/07/SD/05/01– SK | ඔබේ අංකය / உமது இல / Your No: ........................................ | දිනය / திகதி / Date: 2022.03.10 |

සියළුම දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්/ දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන්.

**<u>සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය ජාතික තරඟාවලිය - 2022</u>**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සමෘද්ධි කැකුළු ළමා සමාජයන්හි ගොනු ගත වූ විවිධ කුසලතාවයන් ඇති දරුවන්ගේ සාහිත්‍ය හා සෞන්දර්ය කුසලතාවයන් තවදුරටත් ඔප් නැංවීම සඳහා 2022 වසරේදී ද සමෘද්ධි කැකුළු ළමා සමාජ සාහිත්‍ය හා සංස්කෘතික තරඟාවලිය (සිංහල/දමිළ) බැංකු කලාප, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් වයස් කාණ්ඩ 3 ක් ඔස්සේ පැවැත්වීමට තීරණය කර ඇත. මේ වර්ෂයේ ද නව මුහුණුවරකින් දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කරමින් එකිනෙකාට ගරු කරන සංවේදී හා නිර්මාණශීලි දරු පරපුරක් සඳහා මනස සකස් කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ.

02. 2019 වසරේ අග භාගයේදි ලෝක වාසි සියළු ජනතාව කොවිඩ් වසංගතයත් සමග අර්බුද රැසකට මුහුණ දුන් බව නොරහසකි. ඒ හේතුවෙන් වසර දෙකක් පුරා සියළු වැඩසටහන් යම් පසු බැමකට ලක්ව ඇත. මෙය ජය ගනු වස් සෞඛ්‍ය නිර්දේශ වලට අනුගත වෙමින් මෙම ළමා සමාජ වැඩසටහන යථාර්තයක් දක්වා රැගෙන යාම ඔබ අප සතු ප්‍රමුඛ කාර්යයක් සේ සලකමු.

03. 2002 වසරේ සිට 2019 වසර දක්වා ඉහත ජාතික තරඟාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ හා ඔබගේ කාර්යය මණ්ඩලය දැක්වූ සහයෝගය ස්තුති පූර්වකව සිහිපත් කරමි. සමාජ සංවර්ධන වැඩසටහන තුළ ක්‍රියාත්මක කරනු ලබන සියලුම වැඩසටහන්වල මුඛ්‍ය පරමාර්ථය සමාජය වෙත ගෙන යාමට හැකියාව ඇති පාර්ශවකරුවන් ලෙස, ළමා සමාජ සමඟ එකතු වී ඇති දරුවන් හැඳින්විය හැකි අතර වාර්ෂිකව ක්‍රියාත්මක වන ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය තරඟාවලියට අමතරව ළමා සමාජ දරුවන් සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ද සම්බන්ධ කරගැනීමට ද අපේක්ෂා කෙරේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 288772** |

04. මෙහිදී ග්‍රාමීය ප්‍රජාවගේ ජන ජීවිතය උසස්ව පවත්වා ගැනීමට ප්‍රමුඛතාවය ලබා දෙමින්, අධ්‍යාත්මික සංවර්ධනය තුළින් ආර්ථික සංවර්ධනය ජය ගැනීමට ප්‍රබල ප්‍රතිරෝධකයක්ව පවතින මත් හා දුම්වැටි භාවිතයට විරුද්ධ මතයක් ගොඩ නගමින් මත් හා දුම්වැටි භාවිතය ජන ජීවිතයට කොතරම් බලපෑම් කරන්නේ ද යන්න තේමාව කරගත් පණිවුඩ රැගත් බැනර් බැංකු සංගම්හි, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් තරඟ පැවැත්වෙන ස්ථානයන්හි ප්‍රදර්ශනය කළ යුතුය. මේ බැනර් සඳහා ආදර්ශයට ගත හැකි ආකෘති 04 ක් ඇමුණුම අංක 07 හි සඳහන් වේ. ආකෘති 04 ම මුද්‍රණය කර ප්‍රදර්ශනය කිරීම වඩාත් යෝග්‍ය වේ. එක් බැනරයක් අඩි 06 ක් දිග සහ පළල අඩි 03 ක් විය යුතු අතර එක් බැනරයක් සඳහා උපරිමව වියදම් කළ හැක්කේ රු.1,500/- කි. සමෘද්ධි වැඩසටහනට මාධ්‍ය ප්‍රචාරණයක් ලබා දීම සඳහා බැංකු සංගමයක් එක බැනරයක් හෝ ප්‍රදර්ශනය කළ යුතුයි.

05. බැංකු සංගම්, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටම්වලදී තරග අංශ විනිශ්චය කිරීම සඳහා ඒ ඒ විෂයන් සඳහා නිපුණතාවයකින් යුතු නිලධාරීන් පත් කර ගත යුතු අතර එසේ පත් කර ගන්නා විනිශ්චය මණ්ඩලය ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් විසින් අනුමත කළ යුතු වේ.

06. ඉහත 03 ඡේදයෙහි පරිදි බැනර් සඳහා වන වියදම ද, බැංකු සංගම් මට්ටමේ තරග සඳහා උපරිම රු.15,000/- ක් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ තරඟ සඳහා රු. 25,000/- ක උපරිමයකට යටත්ව සමෘද්ධි කොඩි වැඩසටහනින් රැස්කරන ලද මුදලින් අදාල ප්‍රජා මූල සංවිධාන හරහා හෝ අවශ්‍ය පරිදි ප්‍රාදේශීය සංවිධාන මගින් හෝ වැය දැරීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා අනුමැතිය ලබා දෙන අතර ඒ අනුව ඉදිරි කටයුතු සංවිධානය කළ යුතුය. දිස්ත්‍රික් තරඟ සඳහා වියදම් ඇස්තමේන්තුව ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කෙරේ.

07. තරගාවලිය සම්බන්ධ පොදු උපදෙස් පහත පරිදි දැක්වෙන අතර ඒ අනුව ඉදිරි කටයුතු ක්‍රියාත්මක කළ යුතුය.

- ඇමුණුම අංක 01 - පොදු තරඟ කොන්දේසි
- ඇමුණුම අංක 02 - තරඟ විස්තර
- ඇමුණුම අංක 03 - සිංහල මාධ්‍ය තරඟ ඉසව්
- ඇමුණුම අංක 04 - දමිළ මාධ්‍ය තරඟ ඉසව්
- ඇමුණුම අංක 05 - කාල රාමුව / ක්‍රියාත්මක කිරීමේ වගකීම හා අනුමත කිරීම
- ඇමුණුම අංක 06 - ළමා කතන්දර ලකුණු සටහන් කිරීම (කලාප මට්ටමේ සිට)
- ඇමුණුම අංක 07 - බැනර් සඳහා ආකෘති

08. පසු ගිය වසර වල මෙන් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ පවත්වන තරඟවලදී ජයග්‍රාහී දරුවන් සඳහා ලබා දීමට නියමිත සහතික පත්‍ර ආකෘති දෙක සඳහා වන ග්‍රැෆික් සැලසුම් විද්‍යුත් තැපැල මඟින් ලබා ගන්නා ලෙසද කාරුණිකව දන්වමි.

ආර්.පී. බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : -

| | |
|---|---|
| ලේකම්, සමෘද්ධි,ගෘහ ආර්ථික.ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | -කරු. දැ.ගැ.ස |
| ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - කරු. දැ.ගැ.ස |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - කරු. දැ.ගැ.ස |
| සියලුම අධ්‍යක්ෂවරුන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - කරු. දැ.ගැ.ස |
| සියලුම කළමනාකරණ අධ්‍යක්ෂවරුන්/මුලස්ථාන කළමනාකරු | - කරු. දැ.ගැ.ස |
| සියලුම බැංකු කලාප කළමනාකරුවන් | - කරු. දැ.ගැ.ස |